GMOA
ESTABLISHED IN 1926
TU No. 291
THE GOVERNMENT MEDICAL OFFICERS' ASSOCIATION
No.275/75, Professional Centre, Prof. Stanley Wijesundara Mawatha, Colombo 07
Tel : 2580886 / 2055415 / 0718552552
Fax : 4518668 / 2503586
Web : www.gmoa.lk
Email : info@gmoa.lk
office@gmoa.lk

COVID 19 ගෝලීය වසංගතය ශ්‍රී ලංකාව තුල ව්‍යාප්තිය පාලනය කිරීම අරමුණු කර ගනිමින් රට තුල පරීක්ෂණ පහසුකම් වැඩිදියුණු කිරීම.

රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමයේ නවතම තත්ත්ව වාර්තාව

(2020 අප්‍රේල් මස 15 වැනි බදාදා මධ්‍යහ්න 12.00)

මීට ඉහතදී අප විසින් ඉදිරිපත් කල තත්ත්ව වාර්තාවන්ට වැඩිමනත් වශයෙනි.

එම වාර්තාවන් හරහා කොරෝනා රෝගය පිළිබඳව මේ මොහොත වන විට සමාජය තුල පවතින අවිනිශ්චිතතාවයට බලපාන හේතු විග්‍රහ කරන ලදි.

පවතින අවිනිශ්චිතතාවයට හේතු

1. සමස්ථ රෝගීන්ගෙන් 80% ක් පමණ රෝග ලක්ෂණ නොමැති හෝ සුලු රෝග ලක්ෂණ ප්‍රමාණයක් සහිත වීම හා එම හේතූන් නිසා ඒ අයද නොදැනුවත්ව සමාජය තුල සැඟව සිටිමට ඇති හැකියාව.
2. රෝගය සමාජය තුල සීඝ්‍ර ලෙස ව්‍යාප්ත වීමට ඇති හැකියාව. (කිසිඳු ක්‍රියාමාර්ගයක් ගනු නොලැබුවේ නම් දින 30 ක කාල සීමාවකදී එක් රෝගියෙකුගෙන් නිරෝගී පුද්ගලයන් 400ත් 500ත් අතර පිරිසකට රෝගය බෝ විය හැක)
3. පරීක්ෂණ කටයුතු ප්‍රමාණවත් පරිදි පුලුල්ව සිදු නොකිරීම නිසා රට තුල සිටින සැබෑ රෝගීන් පිළිබඳ තත්ත්වය තවමත් රට ඉදිරියේ අපහැදිලි වීම.

රෝගය පිළිබඳ මේ මොහොතේ පවතින අවිනිශ්චිතභාවය දුරු කොට සමාජය තුල විශ්වසනියත්වයක් ඇති කිරීම සඳහා අප විසින් සිදු කල යුතු ප්‍රධානතම කාර්යය කොරෝනා රෝගීන් හඳුනා ගැනීම සඳහා සිදු කරන පරීක්ෂණ වැඩිදියුණු කිරීම බව රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය විසින් පෙන්වා දෙනු ලැබුවේ 2020 මාර්තු 31 වන දිනය.

පරීක්ෂණ කටයුතු පුලුල් කිරීමේදී අවධානය යොමු කල යුතු කරුණු කිහිපයක් අප විසින් පෙන්වා දෙන ලදි.

1. දැනට ශ්‍රී ලංකාව තුල නිවාස ආශ්‍රිතව පොකුරු වශයෙන් රෝගීන් වාර්තා වන අතර (III වන අදියර) නිරෝධායන ක්‍රියාවලිය සැලකිය යුතු මට්ටමේ සාර්ථකත්වයකින් යුතුව සිදු වන නිසා රෝගී පොකුරු වශයෙන් ගම්මාන ආශ්‍රිතව ව්‍යාප්ත වීම හා සමාජය තුල ව්‍යාප්ත වීම මේ මොහොතේ පාලනය කර ගැනිමට හැකිව ඇත.

2. පසුගිය දිනවල වාර්තා වූ රෝගීන් නිරෝධායන මධ්‍යස්ථානවල නොසිට සමාජය තුළ සිටියා නම් අවසන් අදියර වන සමාජ ව්‍යාප්තියක් දක්වා රෝගය ව්‍යාප්ත වීමේ දැඩි අවදානමක් පැවති බව පැහැදිලිය.

3. වසංගත රෝග විද්‍යා ඒකකයේ දත්ත අනුව මේ වන විට රෝගීන් සමඟ සමීපව ගැටුණු ප්‍රථම මට්ටමේ ස්පර්ශකයන් 3000 කට ආසන්න ප්‍රමාණයක් හඳුනාගෙන ඇත.

   ආරක්ෂක අමාත්‍යංශයට අනුබද්ධ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ දත්ත වලට අනුව මේ වන විට ආසාදිත රෝගීන් සමඟ ස්පර්ශ වූ ප්‍රථම, දෙවන හා තෙවන මට්ටම් වල සමස්ථ ස්පර්ශකයන් 23,000 කට ආසන්න ප්‍රමාණයක් නිරීක්ෂණ මට්ටමේ සිටින බව පැහැදිලිය.

4. මේ මොහොතේ රට තුළ ව්‍යාප්ත ව සිටින මෙම ස්පර්ශකයන් සැබැවින්ම රෝග ආසාදනය වුවන්ද නොවුවන් ද යන වග අපැහැදිලිය. එමෙන්ම මෙම සමස්ථ ස්පර්ශකයන් සංඛ්‍යාව රට තුල ව්‍යාප්තව සිටින ආකාරය පිළිබඳ පැහැදිලි චිත්‍රයක් මේ දක්වා රටට ඉදිරිපත්ව නැත.

5. අප විසින් ඉහත පෙන්වා දෙන ලද අවිනිශ්චිතභාවය දුරු කර රට යළි යථා තත්ත්වයට පත් කර ගැනීම සඳහා ලෝක සෞඛ්‍ය සංවිධානය විසින්ද පෙන්වා දුන් පරිදි අප විසින් ප්‍රධාන කරුණු 2 ක් අවධාරණය කරන ලදි.

I. **සැක කටයුතු සියලු දෙනා ආක්‍රමණශීලී ලෙස පරීක්ෂණ සඳහා යොමු කිරීම.** (Aggressive Testing Strategy)

- එනම් රෝගීන් සමඟ ස්පර්ශ වූ දැනට හඳුනා ගෙන ඇති සැක සහිත සියලු දෙනා පරීක්ෂාවට ලක් කිරීම.
- නිරෝධායන මධ්‍යස්ථාන තුල හෝ නිවාස තුල නිරෝධායනය වී සිටින සියලුම දෙනා රෝගය වැලදී ඇත්දැයි හඳුනා ගැනීම සඳහා පරීක්ෂාවට ලක් කිරීම

II. **එක් වරක් පරීක්ෂා කිරීමේදී රෝගීන් නොවන බවට ප්‍රකාශ වන සියලු දෙනාද නැවත නැවත පරීක්ෂාවට ලක් කිරීම.** (Repeated testing through test test test strategy)

- දැනට සිදුකරන පරීක්ෂණවල සංවේදීතාවය 70% ට වඩා අඩු බැවින් පරීක්ෂණවලට සහභාගී වූ ආසාදිතයන් ගෙන් 30% ට ආසන්න ප්‍රතිශතයක් රෝගය ආසාදනය නොවූවන් ලෙස සමාජයට නිදහස් වීමේ බරපතල අවදානමක් ඇත.
- එබැවින් ලෝක සෞඛ්‍ය සංවිධානය විසින්ද එක් වරක් පරීක්ෂා කර රෝගීන් බවට තහවුරු නොවන පිරිස් පවා නැවත නැවත පරීක්ෂාවන්ට ලක් කිරීම සඳහා නිර්දේශ කරයි. එමගින් පරීක්ෂණයේ සංවේදීතාවයද වැඩි කරගැනීමට හැකිවේ.
- තවද ස්පර්ශකයන් නැවත නැවත පරීක්ෂා කිරීම මගින් රෝගය ආසාදනය වූ නමුත් රෝග ලක්ෂණ නොපෙන්වන හෝ සුළු වශයෙන් රෝග ලක්ෂණ පෙන්වන පිරිස හඳුනා ගැනීමට හැකි වේ.

- **එක් වරක් පමණක් පරීක්ෂාවට ලක් කර රෝගීන් නොවන බවට ප්‍රකාශ වන පුද්ගලයන් නැවත නැවත පරීක්ෂණයන්ට ලක් නොකර සමාජයට මුදා හැරීම ඉතා භයානක බව මේ මොහොතේ අවධාරණය කල යුතුය.** ඒ පිළිබඳව වන තාක්ෂණික ප්‍රවේශය (Algorythm) සෞඛ්‍ය බලධාරීන් විසින් තව දුරටත් කල් නොයවා රට ඉදිරියේ ඉදිරිපත් කල යුතු බව නැවතත් සිහිපත් කරමු.

  උදා –

  a. එම පිරිස් කීවරක් පරීක්ෂා කල යුතුද?
  b. එක් එක් පරීක්ෂණ අතර තැබිය යුතු කාල පරතරය කුමක්ද?
  c. එක් එක් අවස්ථාවේදී භාවිත කල යුතු පරීක්ෂණ ක්‍රමවේදය කුමක්ද?

පරීක්ෂණ වල වර්තමාන තත්ත්වය

අප විසින් නැවත නැවතත් සිදු කරන ලද අවධාරණය කිරීම් හමුවේ මේ වන විට සෞඛ්‍ය බලධාරීන් විසින් පරීක්ෂණ කටයුතු පුලුල්ව සිදු කිරීම ආරම්භ කරමින් සිටියි. ඒ අනුව මීට ඉහතදී දිනකට 200 - 300 ත් අතර සිදු කල පරීක්ෂණ ප්‍රමාණය මේ වන විට 500 ඉක්මවා සිදු වෙමින් පවතී. මෙය තවදුරටත් හැකි උපරිමය දක්වා පුලුල් කිරීම කෙරෙහි බලධාරීන්ගේ අවධානය යොමු විය යුතුය.

ඒ අනුව ඉදිරි සතියක කාලය තුල ඉහත සඳහන් කල දැනට හඳුනාගෙන සිටින 3000 කට ආසන්න පළමු පෙළේ ස්පර්ශකයන් සියලු දෙනා පරීක්ෂාවට ලක් කර අවසන් කල හැකි වනු ඇත. ඒ අය අතුරින් රෝගීන් බව හඳුනාගන්නා සියලු දෙනා වෙන් කර ප්‍රතිකාර කල යුතුය (Case Isolation). එක් වරක් පරීක්ෂා කල විට රෝගීන් නොවන බවට ප්‍රකාශ වන සියලු දෙනාද තාක්ෂණික මඟ පෙන්වීම යටතේ නැවත නැවතත් පරීක්ෂාවන්ට ලක් විය යුතුය.

රට නැවත යථා තත්ත්වයට පත් කිරීම

රට නැවත යථා තත්ත්වයට පත්කර ගැනීම සඳහා රජයේ වෛද්‍ය නිලධාරී සංගමය විසින් අතිගරු ජනාධිපතිතුමා වෙත 2020 අප්‍රේල් 4 වන දින යෝජනාවලියක් භාර දෙන ලදි.

ඊට අමතරව 2020 අප්‍රේල් 12 වන දින අප විසින් අතිගරු ජනාධිපතිතුමා වෙත යොමු කල ලිපිය හරහා තවත් කරුණු කිහිපයක් පෙන්වා දෙන ලදි. (ඇමුණුම I)

එනම්, කොරෝනා (COVID 19) ගෝලීය වසංගතය ලෝක මට්ටමින් යම් පාලනයකට ලක් වන මොහොතක රටට පුද්ගලයන් ඇතුලු වන වරායන් හා ගුවන් තොටුපල විවෘත කිරීමේදී සැලකිලිමත් විය යුතු කරුණු පෙන්වා දෙන ලදි. එහිදී රටට ඇතුලු වන සියලුම පුද්ගලයන් අනිවාර්ය පරීක්ෂණ වලට හා නිරෝධායන ක්‍රියාවලියකට ඇතුලත් කල යුතු බව අප විසින් පෙන්වා දෙන ලදි.

මේ වන විට සමාජ දුරස්ථකරණය ඉලක්ක කරගනිමින් පනවා ඇති සීමා කිරීම් විද්‍යානුකූල පදනමක් මත පමණක් ක්‍රමක්‍රමයෙන් ලිහිල් කල හැක. ලෝක සෞඛ්‍ය සංවිධානය විසින්ද පෙන්වා දෙනු ලබනුයේ පැනවූ තහංචි ඉවත් කිරීම මෙන්ම ලිහිල් කිරීම සඳහා හදිසි නොවිය යුතු බවයි. ඒ සඳහා අප රටට ඇති හැකියාව පිළිබඳ පූර්ව අනාවැකි පල කිරීමට මේ මොහොත කල් වැඩි බව පෙන්වා දෙනු කැමැත්තෙමු.

රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය - 2020 අප්‍රේල් මස 15 වැනි බදාදා දින